# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2110/34 - 2019 පෙබරවාරි මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2019.02.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන නිවේදනයයි

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (422 අධිකාරය) 10 (සී) වගන්තියේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද රෙගුලාසියකි.

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි,
මුදල් මණ්ඩලයේ සභාපති සහ අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

2019 ක් වූ පෙබරවාරි මස 14 වැනි දින,
කොළඹ දී ය.

මුදල් තැරැව්කරණ රෙගුලාසි

**2018 අංක 1 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි සඳහා සංශෝධන**

1.1 මෙම රෙගුලාසි ''2019 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි'' යනුවෙන් හැඳින්විය යුතු ය. — 1. උධෘතය

2.1 2018 මාර්තු මස 05 දින අංක 2061/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරන ලද 2018 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි පහත දැක්වෙන පරිදි සංශෝධනය වේ. — 2. ප්‍රධාන රෙගුලාසිය සඳහා සංශෝධන

1. රෙගුලාසි 12 (ආ) සහ 12(ඊ) අවලංගු කර ඒ සඳහා පහත නව රෙගුලාසි ආදේශ කිරීම.

12(ආ) එක් එක් බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් රෙගුලාසි අංක 12 (අ) හි සඳහන් නිලධරයන් සහ සැලකිය යුතු කොටස් හිමියන්ගෙන් උපලේඛන I, II හා III හි දක්වෙන පරිදි දිවුරුම් ප්‍රකාශ හා අනෙකුත් ප්‍රකාශයන් ලබාගෙන යථා යෝග්‍ය බව ඇගයීම සඳහා, සෑම වසරකම මාර්තු 31 දිනට පෙර දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂවරයා වෙත ලබාදිය යුතුය. සැලකිය යුතු කොටස් හිමියෙකු බාල වයස්කරුවෙකු (වයස අවුරුදු 18 ට වඩා අඩු) ලෙස සැලකේ නම්, යථා යෝග්‍යතා ඇගයීම් ලබාදීම අවශ්‍ය නොවේ.

12(ඊ) මුදල් තැරැව්කරණ රෙගුලාසියෙහි, රෙගුලාසි අංක 13 හි සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂවරයා විසින් බලයලත් මුදල් තැරැව්කරණ ආයතනයක ප්‍රධාන විධායක නිලධාරී, අධ්‍යක්ෂ, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධරයෙකු හෝ සැලකිය යුතු කොටස් හිමියෙකු වශයෙන් යෝජිත පත්වීම් (තව දුරටත් සේවය කරන) වලට අවශ්‍ය ලියකියවිලි ලැබී දින හැටක් ඇතුළත අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හේතු සහිතව අදාළ මුදල් තැරැව්කරණ ආයතනයට දැනුම් දිය යුතු ය.

2. රෙගුලාසි 13(ඉ) සහ 13 (ඊ) අවලංගු කර ඒ සඳහා පහත දැක්වෙන නව රෙගුලාසි ආදේශ කිරීම.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

13. යම් පුද්ගලයෙකු, බලයලත් මුදල් තැරැව්කරණ සමාගමක අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධරයා, ප්‍රධාන කළමනාකරණ කාර්යමණ්ඩල නිලධරයෙකු හෝ සැලකිය යුතු කොටස් හිමියෙකු ලෙස තෝරා ගැනීමට සහ/හෝ පත්කිරීමට හෝ එවැනි පුද්ගලයෙකු එවැනි තනතුරක් දැරීමට හෝ සුදුස්සෙක් නොවන්නේ,

13 (ඉ) එම පුද්ගලයා ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නීතිය මගින් පිහිටුවන ලද යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීමය සංවිධානයක්, යම් පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක් හෝ වෙනත් ආයතනයක් විසින් වංචාවක්, රැවටීමක් හෝ වංක ක්‍රියාවක් වන යම් ක්‍රියාවක් හෝ වෙනත් සමාන සාපරාධී ක්‍රියාවක් පිළිබඳව සිදුකරන විමර්ශනයකට හෝ විභාග කිරීමකට භාජනය වෙමින් සිටී නම් ;

13 (ඊ) යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීමය සංවිධානයක්, පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක් හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නීතිය මගින් පිහිටුවන ලද වෙනත් ආයතනයක් විසින් එම පුද්ගලයා වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ වෙනත් අවිධිමත් ක්‍රියාවක් සිදුකර හෝ එවැනි ක්‍රියාවකට සම්බන්ධව ඇති බව සොයා ගෙන ඇත්නම් ;

3. රෙගුලාසි අංක 14 රෙගුලාසි අංක 14 (අ) ලෙස නැවත නම් කරනු ලබන අතර, පහත නව රෙගුලාසිය රෙගුලාසි අංක 14 (ආ) ලෙස ඇතුළත් වේ.

14 (ආ) බලයලත් මුදල් තැරැව්කරණ සමාගමේ අධ්‍යක්ෂවරු හෝ ප්‍රධාන නිලධරයන් විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හා/හෝ ප්‍රාථමික අලෙවිකරණ ආයතනයක කොටස් හෝ ස්කන්ධ නොදැරිය යුතු සේම පාලනයක් අත්පත්කර ගැනීම නොකළ යුතු ය.

4. රෙගුලාසි අංක 16 යටතේ රෙගුලාසි අංක 16 (උ) ඇතුළත් කිරීම

16. 15 වන රෙගුලාසියෙහි සඳහන් වන අභ්‍යන්තර පාලන පද්ධතියට පහත සඳහන් දේ ඇතුළත් විය යුතු ය.

16 (උ) ගනුදෙනුවලට අදාළ සංවාද පටිගත කිරීමට භාවිත කරන යන්ත්‍ර හා බාහිර පාර්ශ්වයන් වෙතින් ලබාගන්නා අනෙකුත් සේවාවන් සඳහා නඩත්තු කිරීම්වලට අදාළ ගිවිසුම් පවත්වාගෙන යා යුතු ය.

5. රෙගුලාසි අංක 18(ඊ) අවලංගු කර ඒ සඳහා පහත සඳහන් නව රෙගුලාසිය ආදේශ කිරීම.

18 (ඊ) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම විසින් මාසික කාර්යසාධන වාර්තාවක්, අදාළ මාසයට පසුව එළඹෙන මාසයේ පළමු සති 2 ක කාලය ඉකුත් වීමට පෙර මේ සමග අමුණා ඇති ''උපලේඛන IV'' හි සඳහන් පරිදි දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ වෙත, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් වෙත ලබාදෙන ලද මාංගත අතුරු මුහුණත වන ''මූල්‍ය තොරතුරු ජාල පද්ධතිය'' (Fin Net System) මගින් ලැබීමට සැලැස්විය යුතු ය. සියලුම මාසික මූල්‍ය වාර්තා (මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වෙළඳ හා ලාභාලාභ ගිණුම හා ශේෂ පත්‍රය) සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අදාළ කාල පරිච්ඡේදයට පසුව මාසයක කාලයක් තුළ සහ ඊළඟ මාස 6ක කාලය තුළ, පිළිවෙළින් අදාළ වන පරිදි, දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂවරයා වෙත ලබාදිය යුතු ය.

6. රෙගුලාසි අංක 20 (අ) අවලංගු කර ඒ සඳහා පහත සඳහන් නව රෙගුලාසිය ආදේශ කිරීම.

ගිණුම් හා අනෙකුත් වාර්තා පරීක්ෂා කිරීම සහ තොරතුරු ලබාදීම

20 (අ) දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ඔහුගේ දෙපාර්තමේන්තුවේ නිලධරයෙකු විසින් බලයලත් මුදල් තැරැව්කරණ ආයතනයේ ගිණුම් හා අනෙකුත් වාර්තා/ක්‍රියාකාරකම් ඕනෑම අවස්ථාවක පරීක්ෂා කර බලනු ඇත. එවැනි පරීක්ෂාවකට පහසුකම් සලසනු පිණිස, දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ විසින් හෝ ඔහු බලය පවරන ලද නිලධරයෙකු විසින් හෝ ඕනෑම තොරතුරක් ඉල්ලා සිටින සෑම අවස්ථාවකදීම බලයලත් මුදල් තැරැව්කරණ ආයතනය විසින් එම තොරතුරු සැපයිය යුතු ය. දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ විසින් ඉල්ලා සිටින මුදල් තැරැව්කරණ ක්‍රියාකාරකම් හා සම්බන්ධ ඕනෑම තොරතුරක් බලයලත් මුදල් තැරැව්කරණ ආයතනය විසින් අප්‍රමාදව ගිවිසුම්ගත කාලපරිච්ඡේදය තුළ ලබාදිය යුතු ය. බලයලත් මුදල් තැරැව්කරුවන් මෙම රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීමේ අරමුණින්, දේශීය මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂ විසින් කලින් කලට විධානයන්, චක්‍රලේඛයන්, උපදේශයන් සහ චර්යාධර්ම සංග්‍රහයන් නිකුත් කරනු ඇත.

3. වලංගු දිනය

3.1 මෙම සංශෝධන 2019 පෙබරවාරි 14 වැනි දින සිට බලපැවැත්වේ.

03 - 148

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.